## 1.16 පාසැල් විෂයමාලාව තුළ රාගධාරී සංගීත විෂය කෙරෙහි ශිෂ්‍යයින් අඩු නැඹුරුවක් දක්වන්නේ ඇයි?

ලක්ෂානි නිලූපමා බන්දුසේන
123/7, සිංහ මාවත, දඹුල්ල පාර, කුරුණෑගල.

---

## ABSTRACT

කලාවක් ලෙස සංගීත විෂය මානවයා තුළ නව චින්තන ධාරාවක් ගොඩනගයි. එමෙන්ම භාවමය උද්දීපනයක් ඇති කරයි. සංගීතය ස්වරූපය අනුව ශාස්ත්‍රීය හා සරල වශයෙන් දෙ ආකාර වේ. සරල සංගීතය පොදු ජනයා අතර ඉතා ජනප්‍රිය විෂය ක්ෂේත්‍රයක් වන අතර ශාස්ත්‍රීය සංගීතය සාපේක්ෂ වශයෙන් අඩු ජනප්‍රියතාවයක් හිමි කරගෙන ඇත. මෙම තත්ත්වය පොදු සමාජය මෙන්ම පාසැල් ශිෂ්‍ය ප්‍රජාව තුළ ද දැකිය හැක.

සරල සාහිත්‍යයේ පදනම ශාස්ත්‍රීය සංගීතයයි. ලාංකීය පාසැල් විෂය මාලාව තුළ ශාස්ත්‍රීය සංගීතය ලෙස උත්තර භාරතීය රාගධාරී සංගීතය, දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතය, හා බටහිර සංගීතය ඉගැන්වේ. මෙහිදී බහුතර ශිෂ්‍ය සංඛ්‍යාවක් සෞන්දර්ය විෂය ලෙස ඉන්දියානු රාගධාරී සංගීතය තෝරාගනු ලබන අතර, ශිෂ්‍යයා විෂය කෙරෙහි දක්වන උනන්දුව පිළිබඳ පර්යේෂණය ඔස්සේ අවධානය යොමු කෙරිණි. තෝරාගත් උත්තර භාරතීය රාගධාරී සංගීත විෂය හදාරන ශිෂ්‍ය කණ්ඩායමක් වෙත ලබාදුන් ප්‍රශ්නාවලියක් මඟින් දත්ත රැස්කරගත් අතර, සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදය ද භාවිතයට ගැණිනි.

සරල සංගීතයට සාපේක්ෂව ඉහල රසභාවයක් ශාස්ත්‍රීය සංගීතය තුළින් වින්දනය තුළ හැකි වුවද ඒ වෙත යොමුවීමේ දුර්වලතාවන්, භාවිත ක්‍රමවේදයන්හි පවතින ගැටළු, අවම සම්පත් පරිහරණය, ඉගැන්වීම් ක්‍රියාවලියේ දුර්වලතා යනාදිය හේතුවෙන් ශිෂ්‍යයින් අතර රාගධාරී සංගීතය එතරම් රසවත් විෂයක් බවට පත්ව නැති බව පර්යේෂණ ඔස්සේ පැහැදිලි විය.

**මූල පද** - රාගධාරී සංගීතය, සෞන්දර්යය